// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2134/31 - 2019 ජූලි මස 30 වැනි අඟහරුවාදා - 2019.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ පුතුකුඩිඉරිප්පු ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන පුතුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ පුතුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ ඇන්ටන් රත්නරාජා ලාවන්ජා අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායමෙහි කණ්ඩායම් නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නාවූ ද, එම පුතුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාවේ තෝරා ඒවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සෙල්වරාණි අරුලානන්තම් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පුතුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, කාන්දිරාසා කාන්දීපන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් සෙල්වරාණි අරුලානන්තම්, පුතුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

කේ. කාන්දීපන්,
තේරීම්භාර නිලධාරී,
පුතුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාව.

2019 ජූලි මස 29 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මුලතිව්.

08 - 538

1A - G 30639 — 27 (2019/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*